ලංකා බැංකුවේ පූර්ණ අනුබද්ධිත ආයතනයක් වන සී/ස බී ඕ සි මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝට් සර්විසස් (පුද්ගලික) සමාගම විසින් පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති උද්‍යෝගිමත් සහ ඵලදායී ප්‍රතිඵල හඹායන තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

සන්නිවේදන/ ජාල ඉංජිනේරු
(කොන්ත්‍රාත් පදනම මත)

1. අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම්

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) පිළිගත් ආයතනයකින්/ විශ්ව විද්‍යාලයකින් ලබාගත් පරිගණක ජාලකරණය පිළිබඳ උපාධිය/ සයිබර් ආරක්ෂාව/ ජාල ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිය

හෝ

UGC පිළිගත් ආයතනයකින්/ විශ්ව විද්‍යාලයකින් ලබාගත් පරිගණක ජාලකරණය/ සයිබර් ආරක්ෂාව/ ජාල ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂිත වූ තොරතුරු තාක්ෂණය හෝ අදාළ ක්ෂේත්‍රය පිළිබඳ උපාධිය

හෝ

UGC පිළිගත් ආයතනයකින්/ විශ්ව විද්‍යාලයකින් ලබාගත් තොරතුරු තාක්ෂණය හෝ අදාළ ක්ෂේත්‍රය පිළිබඳ උපාධිය සමඟ පහත සඳහන් සුදුසුකම් වලින් අවම වශයෙන් එකක් හෝ සහිතව

CCNA/ NSE 4/ CCSA

2. වෙනත් ගුණාංග

- ස්වයං අභිප්‍රේරිත බව සහ ප්‍රතිඵල දිශාභිමුඛ බව
- ගැටලු නිරාකරණයේ විශිෂ්ටත්වය හා ඉහළ නව්‍යකරණමය හැකියාව
- කාර්යාල වේලාවෙන් පසුව හා සතිඅන්ත/ නිවාඩු දිනවල සේවය කිරීම අපේක්ෂා කෙරේ.

3. පෙර සේවා පලපුරුද්ද

- ජාල හා විදුලි සංදේශ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පලපුරුද්දක් තිබිය යුතුය.

4. වයස් සීමාව

- අවසන් දිනට වයස අවුරුදු 35 හෝ ඊට වඩා අඩුවිය යුතුය.

5. කොන්ත්‍රාත් කාලය

- මුළු කොන්ත්‍රාත් කාලය වසර 03 කි. (වාර්ෂික ප්‍රගති සමාලෝචනයට යටත්ව)

6. වැටුප් පරිමාණය

- සාකච්ඡා කළ හැක. අයදුම්කරුගේ නිපුණතාව මත ආකර්ෂණීය වැටුප් පැකේජයක් පිරිනැමේ.

අයදුම්කිරීමේ පටිපාටිය

- අයදුම්කරුවන් සිය අයදුම්පත් උප්පැන්න සහතිකය/ ජාතික හැඳුනුම්පත, සියලු අධ්‍යාපන සහතික සමඟ අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද සනාථ කරන ලියකියවිලිවල ඡායා පිටපත් සමඟ ලිපිකවරයක බහා අදාළ ලිපිකවරයේ වම් ඉහළ කෙලවර **"සන්නිවේදන/ ජාල ඉංජිනේරු"** ලෙස සඳහන් කොට පහත ලිපිනයට **2026/11/25** දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ පහත සඳහන් ඊමේල් ලිපිනය ඔස්සේ යොමුකළ යුතුය.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ඉහත සඳහන් සුදුසුකම් සපුරා නොමැති නම් හෝ අදාළ ලියකියවිලිවල ඡායා පිටපත් රහිතව ඉදිරිපත් කරනු ලබන හෝ සාවද්‍ය තොරතුරු සපයන ලද සහ අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පසුව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් නැවත දැනුම්දීමකින් තොරව බැඳවා ගැනීමේ කාර්ය පාටිපාටියේ ඕනෑම අවස්ථාවක ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ප්‍රධාන විධායක නිලධාරී
සී/ස බී ඕ සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝට් සර්විසස් (පුද්ගලික) සමාගම,
18 වන මහල, ලංකා බැංකුව - ප්‍රධාන කාර්යාලය,
"ලංකා බැංකු චතුරස්‍රය", අංක 01, ලංකා බැංකු මාවත, කොළඹ 01.
දුරකථන: 011 476 4891
ඊමේල්: career@bocits.lk

BOC IT Solutions (Pvt) Ltd
(A fully owned subsidiary of the Bank of Ceylon)

• කිසියම් හෝ ආකාරයකින් බලපෑම් කිරීම වහාම නුසුදුසුකමක් බවට පත්විය හැකිය. • තෝරාගත් අපේක්ෂකයින් පමණක් කැඳවීමේ අයිතිය සමාගම සතුය. • පිරවිය යුතු තනතුරු සංඛ්‍යාව හෝ බඳවා ගැනීම කල්දැමීමේ/ අවලංගු කිරීමේ අයිතිය සමාගම සතුය.